The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# මුද්‍රා සන්නිවේදනය තුළ පවතින සන්නිවේදනාර්ථ හා අන්තර් සංස්කෘතික ලක්ෂණ

## (තෝරාගත් හස්ත මුද්‍රා කිහිපයක් ඇසුරෙන්)

**අසිත මල්ලවආරච්චි**

කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.

Email: asithaprabhath@gmail.com

## Abstract

This research has studied deeply about nonverbal communication methods in traditional society with a primary focus on hand gestures using semiotic approach. Main aim of the study was to identify the communicative meanings imply by hand gestures. Within the study, as a qualitative research method, content analysis was used to explore the meaning of hand gestures. In relevant to the communicative meanings and intercultural characteristics in gesture communication study, conclusions have been made using data analyzed through content analysis methods.

**Key words:** hand gestures, communication, communicative meanings, statues, semiotics

## හැඳින්වීම

හස්ත චලනය අර්ථ ප්‍රකාශ කිරීමට වඩාත් ඵලදායි නිර්වාචික සන්නිවේදන මෙවලම වේ. සෑම මිනිසෙක් ම නිහඬව ම තම අදහස් ප්‍රකාශ කිරීමේ දි සන්නිවේදනයේ ඌනපූරණය සඳහා හස්ත මුද්‍රා භාවිත කරයි. හස්ත මුද්‍රා ප්‍රධාන වශයෙන් සංස්කෘතික වෙනස්කම් මතු කරයි. එම සංඥා තේරුම් ගැනීමට නම් අන්තර් සංස්කෘතික ප්‍රවේශයක් ඔස්සේ අධ්‍යයනය කළ යුතුය. මුද්‍රා යනු අභිනය හා සම්බන්ධ සංකල්පයකි. වසර දහස් ගණනක ඉතිහාසය තුළ පුළුල් අරමුණු වෙනුවෙන් ඉන්දියාව තුළ මුද්‍රා භාවිත කර ඇත. කතාවක් කීමේ කලාවක් ලෙස මුද්‍රා පසුකාලීනව වර්ධනය වී ඇත. පොදුවේ ගත් කල මෙම මුද්‍රා 200 කට අධික සංඛ්‍යාවක් දැනට හඳුනාගෙන ඇත. මිනිස් මනස හා ශරීරය එක් අරමුණකට ගොනු කරමින් ස්වයං අදහස් ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදයක් ලෙස මුද්‍රා හඳුනාගත හැක. "මුද්‍රා" යන්න අර්ථ ගණනාවක් සහිත වචනයකි. එය අභිනය හැඟවීම සඳහා භාවිත කරනු ලැබේ. භාවයෝගීව ඉන්න අවස්ථාවන් හැඟවීමට භාවිත කරයි. මුද්‍රා තැබීම, සලකුණ ආදි අර්ථ ගණනාවක් ඒ තුළ ගැබ් වී ඇත. ඇසේ පිහිටීම, ශරීර අංග වින්‍යාසය දැක්වීම සඳහා මුද්‍රා

භාවිත වේ. සංකේතවත් ඇඟිලි, ඇස, ශරීර අංග වින්‍යාසයට නිශ්චිත ක්‍රියාවලියක් විචිත්‍රවත් ලෙස පැහැදිලි කිරීමට මුද්‍රාවලට හැකියාව පවතී. එබැවින් මුද්‍රා යන්න පැහැදිලි ලෙස අර්ථ නිරූපණය කරගැනීම මෙම අධ්‍යයනයේ දී ඉතා වැදගත් වේ.

"මුද්‍රා" යන්න ඉංග්‍රීසි භාෂාවෙන් Gesture ලෙස හා Mudra ලෙස භාවිත වේ. මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයට අනුව Gesture යන්න, "අංගහාරය, අදහස් පළ කිරීමේ දී අංග චලනය කිරීම" ලෙස දක්වා ඇත. "අභිනය, ප්‍රතිචාරයන් ලබාගැනීමට, ඉඟියක්, චේතනාවක් දැනවීමට කරන ක්‍රියාව Gesture නම් වේ" (මලලසේකර ශබ්දකෝෂය, 2003, 438 පිටුව). සංක්ෂිප්ත ඔක්ස්පර්ඩ් ශබ්දකෝෂයට අනුව, "A symbolic hand gesture used in Hindu ceremonies and statuary, and in Indian dance" ලෙස දක්වා ඇත. එය හර්මන් (Herman) විග්‍රහ කර ඇත්තේ, "පාදයක හෝ ශරීරයේ සැලකිය යුතු අංගයක හැඟීමක් හෝ ප්‍රකාශනයක් ලෙස භාවිත කරන්නක් මුද්‍රාවක් ලෙස සැලකිය හැක" (Herman, 1993, Page 01). එම අර්ථයෙන් ගත් විට මුද්‍රාව, නිරීක්ෂකයා වෙත පණිවිඩයක් සම්ප්‍රේෂණය කිරීමක් ලෙස සරලව දැක්වීමට පුලුවන.

"සන්නස, පුවරුව, වලංගුබව හඟවන ලාංඡනය, සංඥාව ආදි අර්ථ රාශියක් මේ තුළ ඉදිරිපත් කර ඇත" (Sunohrith English Dictionary, 1899, Page 822). ගුණසේන සිංහල ශබ්දකෝෂය තුළ "මුද්‍රාව" යන්න විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත. එහි සඳහන් වන ආකාරයට "මුද්‍රා" යනු ඇඟිලි පුරුක් හි සංඥා හෝ ලකුණු තබාගෙන ගණන් සෑදීම, ලකුණු මඟින් ගණන් සෑදීම ලෙස ද ඇඟිල්ලෙහි දමන මුද්ද, මුද්දිකා ලෙස ද දක්වා ඇත. "මුද්දරය, ලාංඡනය, අස්සන, මුද්‍රාව" යන්න මුද්‍රා ලෙස සඳහන් වේ. අදහස් ඇඟවීමට අතේ ඇඟිලි ආදිය පිහිටුවා දක්වන ඉඟිය, අභිනය ලෙස දක්වා ඇත (ගුණසේන සිංහල ශබ්දකෝෂය, 2005, 1389 පිටුව).

සෞන්දර්ය අධ්‍යාපනය වෙනුවෙන් සකස් කර ඇති පාරිභාෂිත ශබ්ද මාලාව තුළ ද Gesture යන්න "ඉංගිතය, අංගහාරය" යන අර්ථවලින් දක්වා ඇත (පාරිභාෂිත ශබ්දමාලාව, 1979, 125 පිටුව). සිංහල ශබ්දකෝෂය තුළ "මුද්‍රා පාශක" යන්නට අර්ථ දක්වා ඇත්තේ, "අතේ ඇඟිලි හැකිලීම, දිගහැරීම ආදියෙන් කෙරෙන සංඥා මඟින් අදහස් දැක්වීම" ලෙසය (සිංහල ශබ්දකෝෂය, 1992, 593 පිටුව). "මුද්‍රා භාෂිතය" යන්නට අර්ථ දක්වා ඇත්තේ "සංඥා මඟින් කියන ලද්ද, ඉඟියෙන් පවසන ලද්ද, මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලැබූව" ලෙසය (සිංහල ශබ්දකෝෂය, 1992, 594 පිටුව). "අත්, පා, ඇඟිලි, බැම ආදියෙන් දක්වන භාව ප්‍රකාශනය, මුද්‍රාව" ලෙස ද සිංහල ශබ්දකෝෂයේ දක්වා ඇත (සිංහල ශබ්දකෝෂය, 1992, 594 පිටුව).

පාලියෙහි "මුද්ද" යනුවෙන් මෙම වචනය භාවිත වී තිබේ. "රාජ මුද්ද" යන්න තුළ "රාජකීය ලාංඡනය" හෙවත් "රාජ්‍ය මුද්‍රාව" යන්න මෙයින් අදහස් කෙරේ (බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි, 1962, 245 පිටුව). මුද්‍රාව යනු සංකේතික අභිනයකි. ප්‍රතිමා ශාස්ත්‍රයේදී මුද්‍රාව ලෙස හැඳින්වෙන්නේ ආගමික සංසිද්ධියක් සංකේතවත් කිරීම සඳහා හෝ විවිධ දේවතාවන් සඳහා වෙන්කොට දැක්වීම වෙනුවෙන් අත්වලින් නිරූපණය කෙරෙන විශේෂ ස්වරූපයකි. ආගමික පුද පූජාවලදී ද එහි වාචික අර්ථයන් නිරූපණය කරන්නේ ද මෙම මුද්‍රා මඟිනි. "ධ්‍යානයෙහි දී හෝ ධර්ම දේශනයේ දි අත්වලින් නිරූපණය කරනු ලබන

ඉරියව් "මුද්‍රා" ලෙස රාඕ (Rao. T.A.G) දක්වයි (Rao. T.A.G, 1914, Page 14). ගෙටි (Getty) දක්වන ආකාරයට "මුද්‍රා යන්නෙන් හැඳින්විය හැක්කේ, අත්වලින් නිරූපණය වන ගුප්ත ඉරියව්වකි" (Getty.A, 1928, Page 171). නමුත් කුමාරස්වාමි දක්වන්නේ, "සම්මත හස්ත මුද්‍රාව භාෂාවක්" ලෙසය (Coomaraswamy.A.K, 1928, Page 279-281). මෙම අදහස්වලට අනුව පෙනී යන මූලික අර්ථ නිරූපණය වන්නේ, අත්වලින් නිරූපණය කළ හැකි සංඥා ක්‍රමයක් ලෙස මුද්‍රා භාවිත කළ හැකි බවයි.

"මුද්‍රා" යන්න ඇතැම් අවස්ථාවලදි "හස්ත" යන නමින් ද භාවිත වී ඇත. මුද්‍රාවක් යනු "අත්ලෙන් හා ඇඟිලිවලින් පමණක් නිරූපණය වන ඉරියව්වක්" ලෙස එහිදී කියවේ. ඒ අනුව "හස්ත" යනු මුළු අතින් ම දැක්වෙන විශේෂ ස්වරූපයකි. "මුද්‍රා" හා "හස්ත" යන වචන දෙකෙන් ම ප්‍රතිමාවෙන් නිරූපණය වන දෙවියන්ගේ හෝ ශාස්තෘවරුන්ගේ කිසියම් ක්‍රියාවක් හෝ හැඟීමක් හෝ සංකේතවත් කරයි. මුද්‍රා පිළිබඳව ඉන්දියානුවන් අතර ඇත සිටම පැවත එන අදහසක් ලෙස එය පෙන්වා දීමට පුලුවන. මඤ්ජු ශ්‍රී මූලකල්පයෙහි මුද්‍රා පිළිබඳව සඳහන්වන තැන් කිහිපයකි. එහි දක්වා ඇත්තේ, "මුද්‍රෙඃ, මුද්‍රෙනෙ, මහ මුද්‍රාඃ" (Manju-sri-mulakalpe, Page 423-1, 422-8, 424-9) ලෙසය. ක්‍රිස්තු වර්ෂ ඇරඹීමට පෙර ප්‍රතිමා ලක්ෂණයක් වශයෙන් මුද්‍රා මූර්ති කලාවට එක් විය. "ප්‍රතිමාවන් හි දැක්වෙන මුද්‍රා ගුප්ත පුද පූජාවන්වලදි භාවිත කළ ඉරියව්වලින් විකාශනය වූවකැයි කනෙකා රෝයාන් අදහස් කරයි" (Saunders.E.D, 1960, Page 204). බුද්ධ ප්‍රතිමාවලදී මුද්‍රාව භාවිත කළේ බුද්ධ චරිතයෙහි සුවිශේෂී අවස්ථාවන් සංකේතවත් කොට දැක්වීම පිණිසය. අදහස් ගලායාමත් සමඟ ම බුද්ධ ප්‍රතිමාවෙහි මුද්‍රා වඩාත් විකාශනය වී ගුප්ත අදහසක් ධ්වනිත කිරීම සඳහා යොදාගනු ලැබීය. එම නිසා මූර්තියකින් ධ්වනිතවන අදහස ප්‍රකට කරන මාධ්‍ය වූයේ මුද්‍රාවයි. එක් එක් මූර්තියකට විශේෂ වූ මුද්‍රා ඇති හෙයින් ප්‍රතිමාවක් හඳුන්වාදෙන විශේෂ ලක්ෂණය වන්නේ ද මුද්‍රාවයි.

මජ්ජිම නිකායේ සහ ජාතක කතාවලට අනුව මුද්‍රාව යන්න යෙදි ඇති තැන්වල අර්ථ දෙකක් පවති.

- වලංගුබව දක්වන ඇඟිලි සලකුණ
- අත්වලින් හඟවන සංඥාව හෙවත් සන්නිවේදනය

පන්සිය පනස් ජාතක පොතේ 546 වන ජාතකයේ "හත්ථ මොද්දා" (රංජිත් වනරත්න, 2001, 46 පිටුව) ලෙස දැක්වීමෙන් මුද්‍රාව පිළිබඳ අදහස් දක්වා ඇත. මේ අනුව පෙනී යන්නේ අත්වලින් අදහස් ප්‍රකාශ කිරීමේ කලාව මුද්‍රා ලෙස දැක්විය හැකි බවයි.

ඇඟිලිවලින් රටා දැක්වීම මුද්‍රාව ලෙස ගංගුලි විසින් අර්ථවත් කරනු ලැබ ඇත. "ඇඟිලි හසුරවන ආකාරය මුද්‍රා" බව ඔහුගේ මතයයි. "අත හසුරවන ආකාරය මුද්‍රා" (Getty.A, 1914, Page 171) නම් වේ. "රූපභේද විද්‍යාවේ ඇඟිලි හසුරවන ආකාරය මුද්‍රාව බව" සොන්ඩර්ස් විසින් දක්වා ඇත (Saunders.A, 1960, Page 05).

තාන්ත්‍රික බෞද්ධයින් ප්‍රධාන අර්ථ තුනක් සඳහා මුද්‍රා යන්න යොදාගෙන තිබේ.

- පූජා විධිවලදි අත් හසුරවන ආකාරය,
- ප්‍රතිමාවල ඇඟිලි හසුරවන ආකාරය,
- ශක්ති.

යනු එම අර්ථ තුනයි. මානව රූපයක් නිර්මාණය කරන චිත්‍ර ශිල්පියා හෝ මූර්ති ශිල්පියා විසින් අනිවාර්යයෙන් ම දැනගතයුතු, ප්‍රගුණකළ යුතු හා අනුගමනය කළ යුතු ශිල්පීය මූලධර්ම හයක් පවති. එනම්, රූපභේද, ප්‍රමාණ, භාව, ලාවන්‍ය යෝජන, වර්ණිකාභංග, සාදෘශ්‍යකරණ යනු එම මූලධර්ම හයයි (ධම්මදස්සි හිමි, 2010,12 පිටුව). මුද්‍රාවලට අධ්‍යාත්මික, භාවවිෂයික, ආගමික, සෞන්දර්යාත්මක හෝ ආකල්පමය අදහස් ලබාදීමේ හැකියාව පවති. මුද්‍රා යනු අදහස් ප්‍රකාශ කිරීමට පවතින කෙටි පාරක් හෙවත් අතුරු මාර්ගයක් ලෙස හඳුනාගත හැකිය. මුද්‍රාවන් මනෝභාවයන් ශාරීරිකව ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරන අතර ආකල්ප සංජානනය කර ගැනීමට හා ගැඹුරු දැනුමක් සමග එකඟතාව ලබා ගැනීමට භාවිත කරන සන්නිවේදන ක්‍රමයක් ලෙස පුළුල් ව විග්‍රහ කළ හැකිය.

## මුද්‍රා සන්නිවේදනය

සන්නිවේදනයේ දී වචන මෙන් ම ශරීරය ද එකසේ වැදගත් අංග ලෙස සලකනු ලැබේ. මන්ද යමක් ප්‍රකාශ කිරීමේ දි වචනවලට අමතරව අත්, මුහුණ, කකුල් සිරුරේ අනෙකුත් කොටස්වල අභිනයන් ඇසුරෙන් ද යම් යම් දෑ ප්‍රකාශ කරන හෙයින් ය. ඇතැම් කාරණාවන් අංග චලන මඟින් පමණක් ප්‍රකාශ කරන බැවින් ඒ තුළ ගැබ් වී ඇති අර්ථ ඉතා ප්‍රබලය. එබැවින් වඩාත් සාර්ථක සන්නිවේදනයකට වාචික සන්නිවේදනය පමණක් නොව නිර්වාචික සන්නිවේදනය ද එකසේ වැදගත් වේ.

කැන්ඩන් (Kendon) දක්වන ආකාරයට "භාෂාව හා අභිනය අතර පවතින සබඳතාව එම අභිනය දෙස බලන ආකාරය හා එය අර්ථ නිරූපණය කර ඇති ආකාරය මත රඳාපවතී" (Armstrong and Wilcox, 2007, page 33) විශේෂයෙන් ම මානව සන්නිවේදනය යන්නට වාචික භාෂාව, ලිඛිත භාෂාව හා සංඥා භාෂාව යන වර්ග 3ට ම ඇතුළත් වන බව බිඕන් ලිංබ්ලොන් (Bjorn Lindblom) දක්වා ඇත (Armstrong and Wilcox, 2007, page 33).

එබැවින් අංග චලන මඟින් තොරතුරු සන්නිවේදනය කිරීමේ වැදගත්කම වාචික සන්නිවේදනය තරම් ම එසේ නැත්නම් ඊටත් වැඩිව පවතින බව හඳුනාගත හැක. " Gesture" යන වචනය පළමු අර්ථයෙන් "අභිනය" යන්න හැඳින්වීමටත් භාවිත කරනු ලැබේ. මෙම අධ්‍යයනයේ දී "Gesture communication" නැත්නම් "මුද්‍රා සන්නිවේදනය" යන්න තුළින් අර්ථවත් කරනු ලබන්නේ මෙම අර්ථයන් දෙක ම එකට බද්ධ කරගෙනය. මන්ද හස්ත මුද්‍රාවක් යනු ද අභිනයක් වන හෙයින් ය.

ප්‍රධාන වශයෙන් සලකා බලන විට මුද්‍රාවන් යනු භාෂාවකි. භාෂාවේ ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කරන විට එය ව්‍යුහාත්මක අධ්‍යයනයක් බව පැහැදිලි වේ. එහිදි ප්‍රධාන වශයෙන් ව්‍යුහයන් 2ක් පවතින බව මේ පිළිබඳ අධ්‍යයනය කළ වාග් විද්‍යාඥයින් පෙන්වා දේ. එනම්,

- Sublexical
- Phonological

වශයෙනි. ශබ්දය පදනම් කරගනිමින් එය ලිඛිතව ප්‍රකාශ කිරීමට හැකියාවක් පවතින භාෂා ව්‍යුහය Sublexical ලෙස දක්විය හැකි අතර සංඥාවන් පදනම් කර ගනිමින් පවතින භාෂා ව්‍යුහය Phonological ලෙස හඳුන්වයි. ඒ අනුව මුද්‍රා සන්නිවේදනය යන Phonological ව්‍යුහයට අයත් උප ව්‍යුහයන් ලෙස පැහැදිලි වේ.

මානව භාෂාවේ සම්භවය පිළිබඳව අධ්‍යයනය කරන විට අභිනය ඉතා වැදගත් කාර්යයක් ඉටුකර ඇත. ශරීරයේ අංග චලනය කිරීම මඟින් යම්කිසි සංඥාවක් ලබා දෙන අතර එම අභිනය සතු වී ඇති අර්ථය තේරුම් ගැනීම තුළින් අභිනය කතාවක් ප්‍රකාශයට පත්කරයි. අභිනය හා භාෂාව අතර ඇති පරිණාමීය සබඳතාව හේතුවෙන් නිර්මාණශීලී භාෂාවක් ලෝකයට බිහි වී ඇති අතර ඒ ඔස්සේ සාර්ථක සන්නිවේදනයක් කරා මිනිසා ගමන් කරයි.

## හස්ත මුද්‍රා


සංස්කෘතික ලක්ෂණ විදහාපාමින් අභිනය මඟින් අර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා අපි හස්ත මුද්‍රා භාවිත කරන්නෙමු. ශරීර භාෂාව තුළ "අතට" හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. ඇතැම් විට වචනයෙන් තොරව පුළුල් දෙයක් ප්‍රකාශ කිරීම සඳහා අපට හස්ත මුද්‍රා භාවිත කළ හැකිය.

"හස්ත මුද්‍රා" යනු අන් අය සමඟ තොරතුරු බෙදාගැනීම සඳහා භාවිත කරනු ලබන නිර්වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙස සරලව හැඳින්විය හැකිය. එමෙන් ම විවිධ සංස්කෘතික අර්ථ ගැබ්ව ප්‍රකාශ කළ හැකි සරල මාධ්‍යයක් ද වේ. කොල්ගේට් විශ්වවිද්‍යාලයේ (Colgate University) මනෝ විද්‍යාව හා භාෂාව පිළිබඳ මනෝ විද්‍යාඥයෙකු වන ස්පෙන්සර් කෙලි (Spencer Kelly) විසින් හස්ත මුද්‍රාවලින් ධ්වනිත වන අර්ථ පිළිබඳ දීර්ඝ පර්යේෂණ සිදු කර ඇත.

විශේෂයෙන් ම හස්ත මුද්‍රාවලදී ඇඟිලි, මැණික් කටුව, බාහු හා ඉහළ අත යන අංග චලනය කිරීමෙන් හස්ත මුද්‍රා සකස් කරගනු ලැබේ. වරෙක එක් අතක් හෝ අත් දෙකම භාවිත කර ගැනීමෙන් හස්ත මුද්‍රා සකස් කරගත හැක. එකම මුද්‍රාවක් ගතහොත් එම මුද්‍රාව භාවිත වන අවස්ථාව හා විෂය ක්ෂේත්‍රය අනුව විවිධ අර්ථ ප්‍රකාශ කළ හැකිය. සංස්කෘතිය, සමාජීය ආදි සාධකයන් ද මෙහිදී බලපෑමට ලක් වේ. ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් තුළ භාවිත වන හස්ත මුද්‍රාවන් හා ඒවායේ අර්ථයන් ද එම අර්ථයන් වෙනස් වන ආකාරය ද මෙම අධ්‍යයනයේ දී පුළුල් ව විමර්ශනය කර ඇත.

ප්‍රතිමා යන්නෙන් අදහස් වන්නේ විශේෂයෙන් පිදීම සඳහා යොදා ගනු ලබන නැතහොත් විවිධ ඇදහිලිවලට සම්බන්ධ වූ ශාස්තෘවරයෙකු හෝ දේවතාවකු නිරූපණය කරනු ලබන මූර්තියකි. චිත්‍ර, මූර්ති හෝ කැටයම් වැනි කලා මාධ්‍ය මාර්ගයෙන් මෙබඳු

ප්‍රතිමා නිර්මාණය කරනු ලැබේ. "ග්‍රීක "අයිකොන්" යන්නෙන් ද ඉන්දීය අර්චා, බෙර, විග්‍රහ වැනි වචනවලින් ස්ථිර ලෙසම ධ්වනිත වන්නේ භක්තිකයන්ගේ පුද පූජාවලට භාජනය වන ඍෂිවරයෙකු හෝ දෙවියෙකු නිරූපණය කරන මූර්තියකි. ප්‍රධාන වශයෙන් මෙවැනි මූර්ති මනුෂ්‍යාත්වාරෝපිත හෝ සත්ත්වරූපී නිරූපණ වුවත් සමහර විට එබඳු ස්වරූපයකින් තොර සංකේතික නිරූපණ වුවද ප්‍රතිමා ගණයට අයත් වේ" (Banerjea, J.N, 1956, Page 01) ආගමකට සම්බන්ධ වූ පමණින් ම මූර්තියක් ප්‍රතිමාවක් නොවේ. ශාස්ත්‍රානුකූලව ප්‍රතිමා ලක්ෂණ යොදා තනා ඇති මූර්තිය පිදීමට සුදුසුවන අතර එබන්දක් ප්‍රතිමා නමින් හැඳින්වීමට පුළුවන.




ඇඟිලිවලින් නිරූපිත සන්නිවේදනාර්ථ


සොන්ඩර්ස් දක්වන ආකාරයට "බුදුරජාණන්වහන්සේ දෑත විශ්වය නිරූපණය කරයි. දකුණින් සූර්යයා ද, වමතින් චන්ද්‍රයා ද නිරූපිතය. ඇඟිලි දහයෙන් දස චක්‍ර (රෝද) දශාංශක හෝ දශ පද්ම නිරූපිතය. දකුණින් ඥාන මණ්ඩලය ද වමතින් ධ්‍යානය ද නිරූපිත බව තවත් අදහසකි. දකුණතෙහි ඇඟිලි පහෙන් පංච මහා භූතයන් පිළිබඳ යථාර්ථය අතැඹුලක් සේ දැනගත් අයුරු ද, වමතෙහි සුළැඟිල්ලෙන් දානය ද, වෙදැඟිල්ලෙන් විනය ද, මැදැඟිල්ලෙන් අග්නි ද, දබරැඟිල්ලෙන් සුළඟ ද, මහපටැඟිල්ලෙන් ශූන්‍ය බව ද" නිරූපණය කර ඇති බව සොන්ඩර්ස් ගේ මතයයි (ගමගේ, 1984, පිටුව 12).

සෑම සම්ප්‍රදායකටම අයත් බුදු පිළිම සඳහා ප්‍රධාන වශයෙන් ඇත්තේ සමාධි, ධර්මචක්‍ර, අභය, විතර්ක, වරද හා භූමිස්පර්ෂ යන මුද්‍රා හයයි.

හස්ත සංඥා තුළ පවතින සන්නිවේදනාර්ථ හා අන්තර් සංස්කෘතික ලක්ෂණ විමර්ශනය කිරීමේ දී රූප සටහන් සහිත ප්‍රශ්න මාලාවක් පුද්ගලයන් 200 ක් අතට පත් කරන ලද අතර එම ප්‍රශ්න මාලාවට අනුව මෙම දත්ත විශ්ලෙෂණය කරනලදි. අදාළ මුද්‍රාවට සාමාන්‍ය ව්‍යාවහාරය තුළ ඔවුන් වටහා ගන්නා ආකාරය හා දෙන අර්ථය කුමක්දැයි පරීක්ෂාවට ලක්කළ අතර එම දත්ත මෙහිදි වෙන වෙනම විශ්ලේෂණය කර ඇත. සන්නිවේදනය සඳහා හස්ත සංඥා භාවිත කිරීම සඳහා වයස බලපෑමක් කරන ආකාරය විමර්ශනය කළ යුතු බැවින්

සෑම වයස් කාණ්ඩයකින්ම සමාන සංඛ්‍යාවක් තෝරා ගන්නා ලදි. නමුත් මෙහිදී අදහස් නොදැක් වූ පිරිසෙන් වැඩි ප්‍රතිශතයක් වූයේ අවුරුදු 36-50 අතර වයස් කාණ්ඩය හා 50 ට වැඩි වයස් කාණ්ඩය වීම විශේෂත්වයක් ලෙස දැක්විය හැකිය. සෑම හස්ත සංඥාවකටම සන්නිවේදනාර්ථ දක්වා ඇති වයස් කාණ්ඩ දෙක ලෙස 18-25 වයස් කාණ්ඩයත් 26-35 වයස් කාණ්ඩයත් දැක්විය හැකිය. එය ප්‍රතිශතයක් ලෙස දක්වනවානම් 100% ක් වේ. ඒ ඒ හස්ත සංඥාව තුළින් ධ්වනිත කරනු ලබන සන්නිවේදනාර්ථ මොනවාද යන්න මෙතැන් සිට විමර්ශනය කළ හැකිය. නමුත් මෙහිදි හස්ත මුද්‍රා 03 පිළිබඳ පමණක් මෙහිදි විශ්ලේෂණය කර ඇත. එනම් සමාධි, විතර්ක හා අභය යන මුද්‍රාවන් පිළිබඳවය. ධම්මචක්ක මුද්‍රාව, වරද මුද්‍රාව හා භූමිශ්පර්ෂ මුද්‍රාව පිළිබුදව අවධානය යොමු කොට නොමැත.

**හස්ත මුද්‍රා අංක 01**



ප්‍රතිමා ශිල්පය තුළ මෙය අභය මුද්‍රාව වේ. ලංකාවේ බෙහෙවින් ජනප්‍රිය මුද්‍රාවක් ලෙස අභය මුද්‍රාව සැලකිය හැකිය. මුල් යුගයේ හිටි පිළිම සෑම එකක් සඳහා ම අභය මුද්‍රාව යොදාගෙන ඇත. මෙය ධර්ම දේශනා ඉරියව්වක් ද වේ. මෙම මුද්‍රාව බුදු රජාණන් වහන්සේ නාලාගිරි ඇතු දමනය සඳහා අත ඉදිරියට යොමු කිරීම සංකේතවත් කිරීමෙන් ආරම්භ වුවක් යැයි බොහෝ අය තර්ක කරති. බුද්ධ ප්‍රතිමාවේ දක්වෙන අභය මුද්‍රාව එක් අතකින් සසර බය දුරු කරන ධර්ම දේශනා ස්වරූපයත්, තවත් අතකින් ආරක්ෂාව හා ආශීර්වාදය ලබාදීමත් සංකේතවත් කරන බව ඇතැම් විචාරකයන්ගේ- මතයයි.

රෝමානු මූර්ති කලාවේ ද බහුලව යෙදෙන මෙයින් සෙමිටික් ආගමේ හාස්කම් සහිත ආශිර්වාදයක් නිරූපණය වෙයි. සියලු අතවරවලින් දේව භක්තිකයන් මුදා ගැනීම දේව ප්‍රතිමාවක අභය මුද්‍රාවෙන් පැවසේ. එය විකාශනය වූයේ බලය හා ආධිපත්‍ය පිළිබඳ සංකල්පයක් පදනම් කරගෙන බව ඉන් පෙනේ. සතුන්ට ආරක්ෂාව හා සාමය සලසා දීම මෙයින් ප්‍රකාශ වන්නේ ය. අභය මුද්‍රාව මඟින් ආශීර්වාදය සංකේතවත් කරයි. එමෙන් ම සැනසීම, නිර්භීතභාවය ද ඉන් ජනිත කරයි. බිය දුරු කළ බුදුහු බියට පත් අයගේ බිය නැති කිරීමට ද එයින් මඟ පෙන්වයි.

ධර්ම දේශනය නිරූපණය **කිරීම සඳහා චීන හා ජපන්** කලාවේ ද අභය මුද්‍රාව යෙදෙයි. ශිව වැනි දෙවිවරුන්ගේ ප්‍රතිමාවල **'ගැලවුම්කරුවා'** යන අදහසින් අභය මුද්‍රාව යෙදෙන බව පෙනේ. සමහර විට වෙනත් රටවල එම අදහසින් බුද්ධ ප්‍රතිමා සඳහා ද අභය මුද්‍රාව යොදා තිබෙන්නට ඇති නමුත් ලංකාවේ එම අදහස ගම්‍ය නොවේ.

නාට්‍ය ශිල්පයේ දී මෙම හස්ත මුද්‍රාව **පතාක හස්ත** මුද්‍රාව ලෙස හඳුන්වනු ලැබේ. පතාක හස්තයෙන් **නිරූපිත බිය දුරු කිරීම, වියවුලක් සංසිඳවීම, සභාවක් ඇමතීම, දිවුරුම් දීම හා ආශිර්වාද කිරීම** යන අදහස් අභය මුද්‍රාවෙන් ගම්‍ය වෙයි. විශේෂයෙන් ම **පහර දීම,**

**ගිනි තැපීම, යමෙකු තල්ලු කිරීම හා අධික ප්‍රීතිය** ආදී අවස්ථාවන් නිරූපණය කිරීම සඳහා යොදා ගනී. පතාක හස්ත මුද්‍රාව නළල මත පිහිටුවා ඉදිරිපත් කිරීමෙන් ප්‍රකාශ වන්නේ **"මම යනු ඉතා ගෞරවයට පාත්‍රවන්නෙක්"** යන්නය. **ගිනිදැල් විහිදීම,** වැසි දහර හා මල් වැසි වැස්සවීම ආදිය සඳහා ද පතාක හස්තය භාවිත කරනු ලැබේ. එහිදී ඇඟිලි බොහෝ සෙයින් චලනය කිරීමෙන් ඇතැම් විට අත් දෙකම භාවිත කිරීමෙන් ඉදිරිපත් කරනු ලැබේ. **තරමක් දිය ඇති පොකුණක්, පොළොව මත පිළියෙල කරන ලද කිසියම් ද්‍රව්‍යයක් ප්‍රකාශ කිරීම** සඳහා ද යොදා ගනු ලැබේ.

එමෙන් ම පතාක හස්තය බිමට හැරවීමෙන් ප්‍රකාශ වන්නේ **මදක් විවර වූ හෝ මදක් වැසුණු යමක්** ය. නොඑසේ නම් **නම රැකගත යුතු යමක්, සැඟවුණු යමක් හෝ ඝනව වැඩුණු යමක් හා සැඟවිය යුතු යමක්** ප්‍රකාශ කිරීමට පතාක හස්තය යොදා ගනී. බිම බලාගෙන ක්‍රමයෙන් ඉහළ නගින පතාක හස්ත මුද්‍රාව **වායුව, රළ වේගය, වෙරළේ කැලඹීම හා සැඩ පහර නිරූපණය** කරනු ලබයි. පතාක හස්තය තමන්ගේ ශරීරයේ සිට පිටුපසට ගමන් කිරීම තුළින් **උනන්දු කරවීම, මහා ජන සම්මතයක්, උස් යමක්, බෙර වාදනය හා කුරුල්ලන් පියෑඹීම** නිරූපණය කරනු ලැබේ. එමෙන් ම **කාලය ප්‍රකාශ කිරීම** සඳහා ද පතාක හස්තය භාවිත කරනු ලැබේ.

මදක් හරවන ලද පතාක හස්ත මුද්‍රාවෙන් යුත් දෑත **උඩරට නර්තන සම්ප්‍රදායේ මූලික හස්ත මුද්‍රාව** වේ. එමෙන් ම එකිනෙක මාරු කරන ලද පතාක හස්ත මුද්‍රා දෙක **සබරගමුව නර්තන සම්ප්‍රදායේ මූලික හස්ත මුද්‍රාව** ලෙස සැලකිය හැකිය.





උඩරට, පහතරට හා සබරගමු නැටුම් සම්ප්‍රදායන්වල භාවිත වන ආකාරය

සංඥා භාෂාවට අනුව මෙම මුද්‍රාවෙන් "අ" අර්ථවත් කරනු ලැබේ. එමෙන්ම ඇමරිකානු සංඥා භාෂා අක්ෂර මාලාව තුළ **"B"** අක්ෂරය සඳහා යොදා ගනී.



ඇමරිකානු හා බ්‍රිතාන්‍ය සමාජය තුළ මෙම මුද්‍රාව **" To Stop"** (නතර කරන්න) යන අර්ථය ගම්‍ය කරනු ලැබේ. **පුද්ගලයෙකු පාලනය කිරීමට** ලබා දෙන කදිම හස්ත මුද්‍රාවක් ලෙස මෙය සැලකිය හැකිය. මැලේසියාව හා සිංගප්පූරුව තුළ මෙය **ආචාර කිරීමේ හස්ත මුද්‍රාවක්** ලෙස භාවිත වේ. එමෙන් ම **තවත් කෙනෙකුගේ** අවධානය දිනා

ගැනීම සඳහා ද යොදා ගනු ලැබේ. මෙම අත දෙපැත්තට චලනය කිරීමෙන් වෙන්ව යෑමක් අර්ථවත් කරනු ලැබේ. ඒ අනුව **"Bye" (බායි)** කීම සඳහා යොදා ගන්නා ජනප්‍රිය හස්ත මුද්‍රාවක් ලෙස මෙම හස්ත මුද්‍රාව දැක්විය හැකිය.




හස්ත සංඥාවෙහි සන්නිවේදනාර්ථ අන්තර් සංස්කෘතික වශයෙන් වෙනස්වන ආකාරය

**හස්ත මුද්‍රා අංක 02**




ප්‍රතිමා ශිල්පය තුළ මෙම මුද්‍රාව හඳුන්වනු ලබන්නේ විතර්ක මුද්‍රාව ලෙසය. ලංකාවේ ඉතා ස්වල්ප වශයෙන් දක්නට ලැබෙන එහෙත් බොහෝ රටවල්වල බෙහෙවින් ප්‍රචලිත මුද්‍රාවක් ලෙස විතර්ක මුද්‍රාව හැඳින්විය හැකිය. විතර්ක මුද්‍රාවේ විශේෂත්වය වන්නේ හිඳි පිළිමවල මෙන් ම හිටි පිළිමවලද දක්නට ලැබීමයි.

බුදුන් වහන්සේ අබියසට පැමිණෙන විවිධ පුද්ගලයන් සමඟ වාද විවාද පැවැත්වූ අවස්ථාවන් සංකේතවත් කරලීමට විතර්ක මුද්‍රාව යොදාගෙන ඇත. බුද්ධ චරිතයේ දී උන්වහන්සේ අබියසට පැමිණි විවිධාකාර පුද්ගලයන් මෙන් ම ආගමික නායකයින් සමඟ වාද - විවාදයන් හි යෙදෙමින් නොයෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් කරුණු විග්‍රහ කරමින් සිටි අවස්ථාව මින් නිරූපණය වන බව එහි අදහසයි.

එමෙන් ම මෙම මුද්‍රාවෙන් **අෂ්ටලෝක ධර්ම චක්‍රය, සංසාර චක්‍රය, ධර්ම චක්‍රය** සංකේතවත් වේ. මෙම චක්‍ර ලක්ෂණයෙන් **බුදුන් වහන්සේගේ ප්‍රඥාව, විශ්ව ශක්තිය** පිළිඹිබු කරයි. **මහ කරුණා, මහා ප්‍රඥා** යන දෙක ම එම මුද්‍රාවෙන් සංකේතවත් වේ. විතර්ක මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ පිළිබඳ තවත් මතයක් වන්නේ **අයහපත් දේ වෙන් කර යහපත් දේ පමණක් තෙළා ගන්න** යන අරුතයි. තෙළා ගත් යමක් රඳවාගෙන සිටින ආකාරය මෙයින් ධ්වනිත කරයි.

නර්තන ශිල්පය තුළ පහතරට නැටුම් සම්ප්‍රදායේ මූලික හස්ත මුද්‍රාව ලෙස මෙය දැක්විය හැකිය.




පහතරට නැටුම් සම්ප්‍රදායේ මූලික හස්ත මුද්‍රාව

භරත නැටුම් තුළ මෙම මුද්‍රාව අරාල හස්ත මුද්‍රාව ලෙස හඳුන්වනු ලැබේ. මෙම හස්ත මුද්‍රාවෙන් **ස්ථිරසාර බව, ගර්වය, වීර්යය, කාන්තිය, තැන්පත් බව, දිව්‍යමය වස්තූන්, ගාම්භීර්ය, ආශීර්වාදය, සුභ බව, ප්‍රසන්න බව** නිරූපණය කරයි. තවද අරාල හස්ත මුද්‍රාවෙන් ස්ත්‍රීන්ගේ **කෙස් වැටි බැඳීම් හා විසුරුවීම ද සර්වාංගය පරීක්ෂා කර බැලීම** ද ප්‍රකාශ කරයි.

එකිනෙකට හරස් කරන ලද අරාල හස්ත මුද්‍රාව තුළින් **විවාහ චාරිත්‍ර විධි** ඉදිරිපත් කරන අතර එක් අතක් අනෙක වටා කරකැවීමෙන් **ගිනිමැලය පැදකුණු කිරීම** නිරූපණය කරයි. **වටේ යාම ද පැදකුණු කිරීම ද, මහා ජනසම්පාතයක් ද බිම සරසන ද්‍රව්‍යය** මෙම හස්ත මුද්‍රා ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය. **යම් කිසි පුද්ගලයකු කැඳවීමේ දී,** වැළක්වීමේ දී, **නිර්මාණයක් කිරීමේ දී, බොහෝ වචන පාවිච්චි කිරීමේ දී, දහඩිය පිස දැමීමේ දී, සුවඳක් ආග්‍රහණය කිරීමේ දී හා සියු සුභ දේ** නිරූපණය කිරීමට අරාල හස්ත මුද්‍රාව යොදා ගනු ලැබේ.

බොහෝ රටවල් මෙම හස්ත මුද්‍රාව හා සමාන ආසන්න ස්වරූපය සහිත හස්ත සංඥාව හඳුන්වනු ලබන්නේ **OK** (හරි) සංඥාව ලෙසය. ඒ අනුව **හැමදේම හරි (That everything is good)** යන්න අර්ථවත් කරයි. එමෙන් ම **හොඳයි (Well)** යන්න සඳහා ද මෙම හස්ත මුද්‍රාව භාවිත කරනු ලැබේ. නමුත් ලතින් ඇමරිකාව හා ප්‍රංශය තුළ **අපහාසය කිරීමේ** හස්ත මුද්‍රාවක් ලෙස භාවිත වේ. එනම් **ඔයාගේ ගුද මාර්ගය (your anus)** යන්න ඒ තුළ ගැබ් වී ඇත. නමුත් ඕස්ට්‍රේලියාව හා රුසියාව මෙය 0 **(Zero)** යන්න අර්ථවත් කරනු ලැබේ. ජර්මනියේ මෙම හස්ත මුද්‍රාව භාවිත කරනු ලබන්නේ **සාර්ථක වැඩක් (job well done)** යන්න සන්නිවේදනය කිරීම සඳහා ය. නමුත් නවසීලන්තය තුළ **ඉතා ලාභ (Cheep)** යන අර්ථය ද්වනිත කරයි. තුර්කිය තුළ මෙම සංඥාවෙන් **සමලිංගික සේවනය (Homosexual)** අර්ථවත් කරනු ලැබේ. එමෙන් ම ඇමරිකාව තුළ (හොඳයි, නියත වශයෙන්ම) **Great, Absolutely, fine** යන්න අර්ථවත් කරනු ලැබේ. බ්‍රසීලය තුළ ද **අපහාසය කිරීමේ (Insult)**


හස්ත මුද්‍රාවක් ලෙස ප්‍රසිද්ධය. ජපානය තුළ මුදල් **(Yen)**යන්න සන්නිවේදනය කිරීමේ හස්ත මුද්‍රාවක් ලෙස දැක්විය හැකිය.




හස්ත සංඥාවෙහි සන්නිවේදනාර්ථ අන්තර් සංස්කෘතික වශයෙන් වෙනස්වන ආකාරය

ලාංකීය සමාජය තුළ පොදු ව්‍යවහාරයට මෙම හස්ත සංඥාව බහුලව යොදා ගනු ලැබේ. එහිදි මෙම මුද්‍රාව තුළින් සන්නිවේදනය කරනු ලබන්නේ ආගමානුකූලබව, විතර්ක හස්ත මුද්‍රාව, කොන්ඩමයක්, යම් කාර්යයක් ඉතා හොඳ බව, එකගතාව ප්‍රකාශ කිරීම, අතිවිශිෂ්ටයි, නොම්මර එකයි යන සන්නිවේදනාර්ථයන් ගම්‍ය කරගත හැකිය.


මෙහි දී දත්ත දායකයින් මෙම හස්ත සංඥාවට දුන් සන්නිවේදනාර්ථය තුළ දැකිය හැකි විශේෂත්වය වන්නේ මෙම සංඥාවෙන් කොන්ඩමයක් ප්‍රකාශවන බවයි. එම හඳුනාගැනීම එසේ වන්නට ඇත්තේ කොන්ඩම් ආවරණය තුළ මෙම හස්ථ සංඥාවට සමීප හස්ත රූපයක් ලාංඡනය ලෙස ඇතුළත් කර ඇති බැවින් විය හැකිය. ඒ බව පහත රූපසටහන ඔස්සේ පෙන්වා දියහැකිය. එම දැන්වීමේ දැක්වෙන රූපයේ හා මෙම හස්ත සංඥාව ඉදිරිපත්කරන ආකාරයේ සුලු වෙනස්කම් ඇති නමුත් දත්ත දායකයින් එය ප්‍රීති කොන්ඩම් දැන්වීම මෙයින් නිරූපණය වන බව පවසන්නේ මෙම වෙනස්කම නොතකාය.





හස්ත සංඥාවෙහි සන්නිවේදනාර්ථ අන්තර් සංස්කෘතික වශයෙන් භාවිතවන ආකාරය

**හස්ත මුද්‍රා අංක 03**

භරත නර්තයේ දී මෙම හස්ත මුද්‍රාව ත්‍රිශූල හස්ත මුද්‍රාව ලෙස හඳුන්වයි. ත්‍රිශූල හස්තය භාවිත කරනු ලබන්නේ **ත්‍රිශූලය දැක්වීම සඳහා** ය. ත්‍රිශූලය යනු **හිංදු දෙවිවරුන් හා යෝගීන් භාවිත කරන උල් තුනක් සහිත ආයුධයක්** වේ. එම උල් තුනෙහි හැඩය මෙම දිගු කරන ලද ඇඟිලි තුනෙන් සංකේතවත් කරයි.




ත්‍රිශූල හස්ත මුද්‍රාවෙහි සන්නිවේදනාර්ථ අන්තර් සංස්කෘතික වශයෙන් භාවිතවන ආකාරය




ත්‍රිශූල හස්ත මුද්‍රාව, සංඥා භාෂා අක්ෂරයක් ලෙස වරනැගෙන ආකාරය

සංඥා භාෂාව තුළ "ව" සඳහා මෙම හස්ත සංඥාව යොදා ගනු ලැබේ. ස්විඩන් සංඥා භාෂා අක්ෂර මාලාව තුළ හා ඇමරිකානු සංඥා භාෂා අක්ෂර මාලාව තුළ **"W"** අකුර සඳහා මෙම හස්ත මුද්‍රාව යොදා ගනු ලැබේ.


බ්‍රිතානයේ බේඩන් ෆවල් විසින් හඳුන්වා දෙන ලද **බාලදක්ෂ ව්‍යාපාරයේ නිල ලාංඡනය** මෙම හස්ත මුද්‍රාවෙන් නිරූපණය වේ.



ත්‍රිශූල හස්ත මුද්‍රාවෙහි, සන්නිවේදනාර්ථ අන්තර් සංස්කෘතික වශයෙන් භාවිතවන ආකාරය

ලාංකීය සමාජය තුළ පොදු ව්‍යවහාරයට මෙම හස්ත මුද්‍රාව බහුලව යොදා ගනු ලැබේ. එහිදී මෙම මුද්‍රාව තුළින් සන්නිවේදනය කරනු ලබන්නේ අංක 03, බාලදක්ෂ මුද්‍රාව, බෞද්ධ ලාංඡනයකි, සැලියුට් කිරීම යන්න ගම්‍ය කිරීම සඳහාය.

**හස්ත මුද්‍රා අංක 04**



බුද්ධ ප්‍රතිමා තුළ මෙම හස්ත මුද්‍රාව **සමාධි හස්ත මුද්‍රාව** ලෙස හැඳින්වේ. මෙම මුද්‍රාව හිඳි පිළිම සඳහා යොදා ගනී. වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් වැඩසිටින බුදුරජාණන් වහන්සේ ගේ දෑත, වම් අත්ල මත දකුණු අත්ල තබාගෙන සිටීම ධ්‍යාන හෙවත් සමාධි මුද්‍රාව ලෙස හැඳින්විය හැක.

සමාධිය යනු **සිතේ එකඟතාවයි**. ත්‍රිවිධ ශික්ෂාවන්ගෙන් දෙවන තැන හිමිවන්නේ සමාධියටයි. **බුද්ධත්වය** සංකේතවත් කරන සමාධි හෙවත් ධ්‍යාන මුද්‍රාවෙන් නිමවන ලද බුද්ධ ප්‍රතිමාව තුළින් උන්වහන්සේගේ **අපිරිමිත මහා කරුණාව** මූර්තිමත් කෙරේ. ඒ සමඟ ම ඉතා **ගැඹුරු වූත් ශුක්ෂම වූත් ධ්‍යානයට සමවන් විලාසයෙන් පරම ගාම්භීර වූ ප්‍රඥා මහිමය ප්‍රකට කෙරේ**. සමාධිමය අවස්ථාව දැක්වෙන මෙම මුද්‍රාවෙන් **අධ්‍යාත්මික ඒකාග්‍රතාව** ද පිළිබිඹු වේ.

අල්ල උඩට පිහිටන සේ වම් අත තබා ඒ මත අල්ල උඩට සිටින සේ දකුණු අත තබාගෙන කඳ කෙළින් තබාගෙන සිටිති. භාවනා කරන විට ද මේ අන්දමට අත් තබාගෙන සිටීම සිරිතකි. ධ්‍යානවලට සමවැදී ඉන්නා අවස්ථාව ද මීට සමාන බැවින් ධ්‍යාන හා සමාධි යන වචන දෙක ම මේ මුද්‍රාව හැඳින්වීමට යොදාගනී.

මහායාන සම්ප්‍රදායේ බුදුන් වහන්සේ **නාගයන් මුදා ගැනීම** ධ්‍යාන මුද්‍රාවෙන් සංකේතවත් කරයි. ධ්‍යානි බුදුවරුන්ගේ අමෝඝසිද්ධි බුදුන්වහන්සේට හිමි මුද්‍රාව මෙයයි. සමාධි මුද්‍රාවෙන් බුදු කෙනෙකුගේ ලෝකෝත්තර චිත්ත සමාධිය එක් අතකිනුත් අනෙක් අතින් වඩාත් සංවර්ධිත අදහස වශයෙන් **බුද්ධත්වයත්** සංකේතවත් කරනු ලබයි.

එමෙන් ම අනෙක් අතට කලාකරුවා මූලික වශයෙන් අඟවන්නට උත්සහ දරා ඇත්තේ බුදුන් වහන්සේ විවේකීව වැඩසිටින හැම අවස්ථාවක දී ම **බාහිර අරමුණුවලින් තොරව නිවන පිළිබඳව සිත යොමු කොට සැහැල්** මනසකින් වැඩසිටින බවයි. සමාධි ඉරියව්වේ ද **අල්ප ශබ්දතාව, ගණසංගණිකාවෙන් තොර බව, හුදෙකලා බව, අල්ප කෘත්‍යතාව, සැහැල්** බව ආදී වශයෙන් පාරිසරික යෝග්‍යතාව අතිශයින් ම අවශ්‍යය. එම නිසා භාවනානුයෝගියා ආරණ්‍යයක් හෝ වෘක්ෂ මූලයක් හෝ සූන්‍යාගාරයක් හෝ සත්පාය ස්ථානයක් වශයෙන් සකස් කර ගත යුතුය.


ධ්‍යාන වඩන්නා සිටිය යුතු ඉරියව්ව සමාධි ඉරියව්ව වේ. ග්‍රාහකයාට සැබෑ ලෙසට මෙකී කාරණාව ධ්වනිත වන්නේ ද යන්න මීළඟට විමසා බැලිය හැකිය. එහිදී ඉන්දියාවේ ජවහල් ලාල් නේරුතුමා සිරගතව වී සිටි අවස්ථාවේ දී අනුරාධපුර සමාධි බුදුරුවේ පිංතූරයක් බලා **''මෙම බුදු පිළිමයෙහි ශක්තිමත් ශාන්ත ලක්ෂණයක් මා සනසා මට ධෛර්ය දී මා පිළිබඳ ඇති වූ බොහෝ අධෛර්යවත් කාල පරිච්ඡේදයන්හි දී මට පිළිසරණ විය''** යනුවෙන් සඳහන් කොට ඇත. නිවන කෙළවර කොට ගත් ශාරීරික හා මානසික ඒකමිතිය උපදවන සමාධිය, සමාධි මුද්‍රාවේ සංකේතවත් වේ.

අනෙක් අතට මෙම සමාධි මුද්‍රාව බෞද්ධ දර්ශනයට පමණක් සීමාවූවක් නොවේ. භගවත් ගීතාව ද යෝගී ඉරියව්ව විස්තර කිරීමේ දී ධ්‍යාන මුද්‍රාව පිළිබඳව සඳහන් කරයි. "ධ්‍යානි යෝගී ශිව ගේ ස්වරූපය විස්තර කරමින් පද්මාසනයෙහි ඍජු කයෙන් සිටින ශිව උඩු අතට යොමු කළ අත්ල සහිත දෑත උකුළ මත මනාව පිපුණ කුසුමක් සේ තබා සිටින්නේ යැයි කාලිදාස පවසයි". මෙම යෝගී ඉරියව්වේ විවිධ ප්‍රභේද භාරතීය මූර්ති මගින් නිරූපණය කරයි. "ක්‍රි.පු 2-3 වැනි ශතවර්ෂවලට අයත් උජ්ජේනි තඹ කාසියක ඇති පද්ම පීඨය සහිත දේව රූපයක ධ්‍යාන මුද්‍රාවට ආසන්න ස්වරූපයකින් දෑත නිරූපණය කර ඇත".

ලාංකීය සමාජය තුළ පොදු ව්‍යවහාරයට මෙම හස්ත මුද්‍රාව බහුලව යොදා ගනු ලැබේ. එහිදී මෙම මුද්‍රාව තුළින් සන්නිවේදනය කරනු ලබන්නේ භාවනා කරන ආකාරය, ආගමානුකූලබව, සිතෙහි පවතින සංසුන් බව, සරලබව, සිතෙහි එකඟතාව ප්‍රකාශ කිරීම, බුදුන් වහන්සේ යන්න ගම්‍ය කරගත හැකිය.

## නිගමනය

සන්නිවේදන ක්‍රියාවලිය තුළ හස්ත මුද්‍රා භාවිතයේ දී ග්‍රාහකයා මෙන් ම සන්නිවේදකයා ද අභිප්‍රේරණ මානයක් කරා ගෙන යනු ලබන සංජානනීය මාධ්‍යයක් වශයෙන් හස්ත මුද්‍රා හඳුනාගත හැකිය. එය සාර්ථක සන්නිවේදනයකට මඟ පාදන්නකි. විශේෂයෙන් ම මානව සම්බන්ධතා ඇති කිරීමට, පවත්වාගෙන යාමට හා වර්ධනය කර ගැනීමට මෙන් ම නතර කිරීමට ද ක්ෂණිකව මඟ පාදනු ලබන සන්නිවේදන මෙවලමකි. එය චක්‍රයක් ලෙස පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.




මෙම සෑම අතරමැදි ස්ථානයකදී ම හස්ත මුද්‍රා භාවිත කරන අතර එයින් සංජානනීය කාර්යය වඩා සක්‍රීය කරනු ලැබේ. එමෙන් ම ක්‍රියාවන් හා වචන අතර පවතින සම්බන්ධය හා සමාන සම්බන්ධන්තාවක්, හස්ත මුද්‍රා හා වචන අතර පවතින බව නිගමනය විය. ඒ අනුව සන්නිවේදන ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට හස්ත මුද්‍රා ඉතා මහඟු මෙහෙයක් සිදු කරයි. එය මෙම රූප සටහනෙන් වඩාත් තීව්‍ර වේ.



එක පැත්තකින් එකම සංසිද්ධියට හස්ත මුද්‍රා කිහිපයක් තිබෙන අතර අනෙක් පැත්තෙන් එකම හස්ත මුද්‍රාවට සංසිද්ධි ගණනාවක් ඉදිරිපත් කළ හැකිය. එය අන්තර් සංස්කෘතික වශයෙන් ප්‍රබලව බලපානු ලබන දෘශ්‍යමාන ක්‍රියාවලියකි. ඒ අනුව කථකයා පමණක් නොව ග්‍රාහකයා ද මෙම දෙයංශය කෙරෙහි අවබෝධයක් තිබීම සාර්ථක සන්නිවේදනයකට මඟ පාදනු ලැබේ. ඒ අනුව සන්නිවේදනය කිරීමේ දී මුද්‍රා සන්නිවේදනය යොදා ගැනීමේ මූලික අරමුණු කිහිපයක් ඉෂ්ට කරගත හැකි බව නිගමනය කළ හැකිය.

- **වචන සමඟ එකතු වීමෙන් පැහැදිලි අර්ථ ගැන්වීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**
- **අදහස් රංගනයෙන් ප්‍රකාශ කිරීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**
- **කතා කරන වචන අවධාරණය කිරීමට හා එයට යම්කිසි ජවයක්, ශක්තියක් එකතු කිරීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**
- **ස්නායු තුළ පවතින ආතතිය අවම කිරීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**
- **දෘශ්‍ය ආධාරක ලෙස භාවිත කිරීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**
- **ප්‍රේක්ෂක / ග්‍රාහක සහභාගීත්වයේ උත්තේජනයක් ඇති කිරීමට හස්ත මුද්‍රා යොදා ගත හැකිය.**

හස්ත මුද්‍රාවල සන්නිවේදනාර්ථ පිළිබඳව පුළුල් එකඟතාවක් නොමැති බව මෙහිදී පැහැදිලි ය. එයට මූලික හේතුව වන්නේ අන්තර් සංස්කෘතික වශයෙන් විවිධ සමාජ එම හස්ත මුද්‍රාවලට ලබා දී ඇති අර්ථ හා වටිනාකම් මතය. ඒ අනුව හස්ත මුද්‍රා **"අන්තර් භාෂිත සංකේත සමුදායක්"** ලෙස අපට හඳුනාගත හැකි ය. එහිදී මානව භාෂාව හා හස්ත මුද්‍රා, අන්තර් සංස්කෘතික වශයෙන් පරිණාමීය යාන්ත්‍රණයක් සහිත විෂය ක්ෂේත්‍රයක් ලෙස දැක්විය හැකි ය. සංස්කෘතික විවිධත්වය යන කාරණාව තුළ පවතින විභවය අභියෝගාත්මක නිසා වාග්විද්‍යාත්මක තොරතුරු මත හා දෘශ්‍ය තොරතුරු මත හස්ත මුද්‍රා වර්ග කිරීමට උත්සහ ගෙන ඇතත් මෙම අධ්‍යයනයෙන් නිගමනය කර ඇත්තේ භාෂාමය සන්දර්භය තුළ හස්ත මුද්‍රා විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට අදාළව ස්වභාවය හා ආකෘතිය අනුව හස්ත මුද්‍රා යොදාගත හැකි බවයි. අනෙක් අතට භාෂාවේ කාර්යසාධනය සඳහා විශේෂයෙන් ම හස්ත චලන භාවිත කරන බව ද නිගමනය කර ඇත. ප්‍රධාන වශයෙන් සන්නිවේදකයා හා ග්‍රාහකයා යන දෙපාර්ශවය ම පොදුවේ සන්නිවේදනය කිරීමේ දී හස්ත මුද්‍රා භාවිත කරන බව ගම්‍ය විය. නමුත් එහිදී භාවිත කරන්නාගේ අන්තර්ක්‍රියා හා සංස්කෘතික පදනම මත එම හස්ත මුද්‍රාවල සන්නිවේදනාර්ථ වෙනස් වන බව නිගමනය කළ හැකිය.

## පරිශීලිත ග්‍රන්ථ


Armstrong, David F. (2007), The Gestural Origin of Language, Oxford. University Press.

Barthes, R. (1968), Elements of Semiology, New York, Hill and Wang.

Ferdinand, Saussure. (1978), Fundamentals of Semiology, New York, Hill and Wang.

අමරතුංග, úchisß. (1997), ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති කලා, කර්තෘ ප්‍රකාශනයකි.

අමරසිංහ, මාලිංග. (2004), ලක්දිව සුපතල බුදුපිළිම, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසිංහ, මාලිංග. (2010), ලක්දිව බුද්ධ ප්‍රතිමාව, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

ධම්මදස්සි හිමි, දොඩම්කුඹුරේ. (2010), ශ්‍රී ලංකේය බුද්ධ ප්‍රතිමා ලක්ෂණ, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, විමල්. (2010), නව විචාර සංකල්පඃ ඥාන ක්ෂේත්‍රයෙහි ප්‍රවණතා, බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ.

දේවේන්ද්‍ර, ඩී. ටී. (1967), බුද්ධ ප්‍රතිමාව හා ලංකාව, කොළඹ, ගුණරත්න සහ සමාගම.

රතනසාර ස්ථවිර, තිරාණගම. (1985), ආසියාවේ බෞද්ධ කලා අංක 2 බුදුපිළිම, කොළඹ, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

රතනසාර, තිරාණගම හිමි. (1985), ආසියාවේ බෞද්ධ කලා 1, කොළඹ, රජයේ මුද්‍රණාලය.

රාහුල හිමි, වල්පොල. (1989), ලක්දිව බුදු පිළිමයේ ඉතිහාසය, කොළඹ, ගුණසේන සහ සමාගම.

වනරතන, රංජිත්. (සංස්කරණය), (2001), ලීනාර්ථ වර්ණනා සහිත උම්මග්ග ජාතකය, මරදාන, සමයවර්ධන පොත්හල.

වනරතන හිමි, කඹුරුපිටියේ. (1985), ලක්දිව බුදු පිළිමය, මාතර, මාතර වෙළෙන්දෝ.

වනරතන හිමි, කඹුරුපිටියේ. (1990), ශ්‍රී ලංකාවේ කැටයම් හා මූර්ති, කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වත්තල, සරත්. (1962), කලාව හා ශිල්ප ශාස්ත්‍ර, කොළඹ, ගුණසේන සහ සමාගම.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1962), ප්‍රතිමා ප්‍රමාණ මූලධර්ම, නුගේගොඩ, කපිල මුද්‍රණ ශිල්පියෝ.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1990), මූර්ති, කැටයම් කලාව, කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1970), පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය, කොළඹ, ගුණසේන සහ සමාගම.

විමලරතන හිමි, බෙල්ලන්විල. (1991), බුදු පිළිමය, මුද්‍රා හා ආසන, කර්තෘ ප්‍රකාශනයකි.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (2006), ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව. මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

විරසිංහ, ටියුඩර්. (2012), ජනමාධ්‍යවේදය, සංහතික මාධ්‍යයන්ගේ සංඥාර්ථවේදය, සංඥාර්ථවේදී ප්‍රවේශය, වෙළුම 03, 2012, හොරණ, මාධ්‍ය පර්යේෂණ අංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

ලගමුව, ඒ. (1999), ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්‍ෂණ, පර්යේෂණ ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

සුමනපාල, ගල්මංගොඩ. (1962), ආදි බෞද්ධ දර්ශනය, අභය මුද්‍රණ ශිල්පියෝ.

සෝමරත්න, එච්. එම්. (පරිවර්තන). (1962), මධ්‍යකාලීන සිංහල කලා, කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

කෝට්ටගොඩ, ජයසේන. (2008), පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය, කර්තෘ ප්‍රකාශනයකි.

ගනේගොඩ, ප්‍රීති. (2004), ඉංදීය නාට්‍ය ලාලිත්‍ය, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

චන්ද්‍රලාල්, ජගත්. (2008), කථක් නර්තනය, කර්තෘ ප්‍රකාශනයකි.

තුෂාන්, නිලංක. (2009), ශ්‍රී ලංකාවේ නිර්මාණ නර්තනයේ බටහිර මුහුණුවර, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මකීර්ති, රංජිත්. (2008), නාට්‍ය ප්‍රවේශය, කර්තෘ ප්‍රකාශනයකි.

දිසානායක, මුදියන්සේ. (1994), ආසියාවේ නාට්‍ය කලාව හා නර්තන කලාව, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (පරිවර්තනය). (2008), කථකලි නර්තන කලාව, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (1995), සිංහල නර්තන කලාව, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

මාරසිංහ, වෝල්ටර්. (පරිවර්තනය), (2005), නාට්‍යය ශාස්ත්‍රය (ද්විතීය භාගය), මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

මාරසිංහ, වෝල්ටර්. (පරිවර්තනය). (2005), භරතමුනි නාට්‍ය ශාස්ත්‍රය, ද්ùතීය භාගය, මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

රසාදරි, සිරිමති. (1998), නර්තන කලා, කර්තෘ ප්‍රකාශනයකි.

රණතුංග, මද්දුමගේ කුමුදුනි රූපසිකා. (2001), කතක් නර්තනය, නුගේගොඩ, අමරදයා, 27/2, ඩී.ඇම් කොළඹගේ මාවත, නාවල.

හරිස්චන්ද්‍ර, පුත්තලමේ. (1998), යෝග විද්‍යා පාඨමාලා, කොළඹ, එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම.

හතුරුසිංහ, ලයනල් පී. (1994), විශේෂ අවශ්‍යතා ඇති ළමයින් සඳහා අධ්‍යාපනය, ඩල්සි මානෙල් ගුණසේකර ප්‍රකාශනයක්.